| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>Education Zone - Piliyandala | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>Mid Year Evaluation | | | |
| ශ්‍රේණිය Grade } 11 | විෂයය Subject } බුද්ධ ධර්මය | පත්‍රය Paper } I | කාලය Time } පැය 01යි |

නම ..............................................        විභාග අංකය ......................

සැලකිය යුතුයි:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටස සඳහා ලකුණු 40කි.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- සැපයෙන පිළිතුරු පත්‍රයේ පිටු පස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

01) ගිහි බෞද්ධයන් රැකිය යුතු නිත්‍ය සීලය,

1. පංච ශීලයයි  2. අෂ්ටාංග ශීලයයි
3. දස ශීලයයි  4. ආජීව අෂ්ටමක ශීලයයි

02) දුටුගැමුණු මහ රජතුමා තැනූ ස්තූප දෙක වන්නේ,

1. මිරිසවැටිය හා අභයගිරියයි  2. අභයගිරිය සහ ජේතවනයයි
3. මිරිසවැටිය සහ රුවන්වැලිසෑයයි  4. රුවන්වැලිසෑය සහ ජේතවනයයි

03) පංචනීවරණ ධර්ම අතරට ගැනෙන සිතෙහි නොසන්සුන් ගතිය හඳුන්වන්නේ,

1. කාමච්ඡන්ද නමිනි  2. ව්‍යාපාද නමිනි
3. ථීන මිද්ධ නමිනි  4. උද්ධච්ච කුක්කුච්ච නමිනි

04) සිදුහත් කුමාරයා මතු බුදු වන බවට අනාවැකියක් කී මුල්ම තැනැත්තා වූයේ,

1. කොණ්ඩඤ්ඤ බමුණා යි  2. ආලාර කලාම යි
3. සහම්පතී මහා බ්‍රහ්මයා යි  4. අසිත තවුසා යි

05) " සිංහලයිනි නැඟිටිවු, බුද්ධයාව බේරාගනිව් ' යන උද්යෝග පාඨය ඉදිරිපත් කරමින්, බුද්ධගයාව බේරාගැනීමට කටයුතු කළේ,

1. අනගාරික ධර්මපාල තුමා ය  2. වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා ය
3. මිගෙට්ටු වත්තේ ගුණානන්ද හිමි ය  4. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය

06) " ඔබට සැක ඇතිවී තිබෙන්නේ සැක කළ යුතු තැනක ය. යමක් ඇසූ පමණින්, පරම්පරාවෙන් ආ පමණින් නොපිළිගන්න " බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළේ,

1. උපාලි ගෘහපතියාට ය  2. කාලාම වැසියන්ට ය
3. විසාලා මහනුවර වැසියන්ට ය  4. සුප්පිය පිරිවැජියාට ය

07) " චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. " මෙම විවරණය අනුව කිසියම් ක්‍රියාවක් කර්මයක් වීම සඳහා,

1. චේතනාව අත්‍යවශ්‍ය වේ.
2. අකුසලය අත්‍යවශ්‍ය වේ.
3. දෘෂ්ටිය අත්‍යවශ්‍ය වේ
4. කුසලය අත්‍යාවශ්‍ය වේ.

08) තිදොරින් සිදුවන අකුසල ක්‍රියා ගණයට අයත් නොවන කරුණ වන්නේ,

1. අභිධ්‍යා යන්නයි
2. ව්‍යාපාදය යන්නය.
3. මිත්‍යා දෘෂ්ටිය යන්නයි
4. සක්කාය දිට්ඨි යන්නයි

09) ලෝකයේ යථා ස්වභාවය අනිත්‍ය, දුක්ඛ, අනාත්ම දකිමින් සිත වැඩීම,

1. සමථ භාවනා නම් වේ.
2. විදර්ශනා භාවනා නම් වේ.
3. පිළිකුල් භාවනා නම් වේ.
4. අසුභ භාවනා නම් වේ.

10) දෙව් මිනිසුන්ට මාර්ගෝපදේශක ශාස්තෘවරයාණන් වූ බැවින් බුදුරජාණන් වහන්සේ,

1. සම්මා සම්බුද්ධ නමින් හැඳින්වේ
2. සුගත නමින් හැඳින්වේ
3. ලෝකවිදූ නමින් හැඳින්වේ
4. සත්ථා දේව මනුස්සානං නමින් හැඳින්වේ

11) " සිවුසස් " දහම ලෙස හැඳින්වෙන්නේ,

1. සතර සංග්‍රහ වස්තුයි
2. චතුරාර්ය සත්‍යයයි
3. සිව් බඹ විහරණයි
4. සතර සෘද්ධි පාදයි

12) භික්ෂූන් වහන්සේලාගේ " කායික නීරෝගීතාව " සලකා බුදුරජාණන් වහන්සේ " සක්මන් මළුව " අනුමත කළ සේක. ඒ සඳහා ඉල්ලීමක් කළේ ,

1. අනේ පිඬු සිටුතුමා ය
2. ජීවක වෛද්‍යවරයා ය
3. මිගාර සිටුතුමා ය
4. කොසොල් රජු ය

13) නිවැරදි රැකියාවක් කිරීම මංගල කරුණකි. මේ පිළිබඳ මහා මංගල සූත්‍රයේ සඳහන් වන පාලි පාඨය වන්නේ,

1. පූජාච පූජනීයානං
2. ඵුට්ඨස්ස ලෝක ධම්මෙහි
3. අසේවනාච බාලානං
4. අනවජ්ජානි කම්මානි

14) බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය ධර්මය අන්තර්ගත කොට පස්වග භික්ෂූන් වහන්සේලා අමතා දේශනා කළේ,

1. දම්සක් පැවතුම් සූත්‍රයයි
2. අනත්ත ලක්ඛණ සූත්‍රයයි
3. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි
4. පරාභව සූත්‍රයයි

15) සාර්ථක ජීවිතයකට මං පෙත් හෙළි කර දෙන " බෞද්ධයාගේ අත්පොත " ලෙස සැලකෙන්නේ,

1. සිරිත් මල්දමයි
2. ධම්ම පදයයි
3. පිරුවානා පොත් වහන්සේයි
4. පන්සිය පනස් ජාතක පොත් වහන්සේයි

16) ආලවක, අංගුලිමාල, සච්චක වැනි අය දමනය කිරීමෙන් ප්‍රකට වන්නේ, බුදුරජාණන් වහන්සේගේ,

1. තාදී ගුණයයි 2. පුරිසධම්ම සාරථී ගුණයයි
3. මහා කරුණා ගුණයයි 4. අසරණ සරණ ගුණයයි

17) ගුවන් විදුලි දේශනාවට සවන් යොමු කළ සිසු දරුවන්, අනාගතයේදී කිසිදු දිනක වැරදි කර්මාන්තයේ නොයෙදීමටත්, යහපත් ජීවිත වෘත්තීන් හි පමණක් නියැළීමටත් තරයේ අදිටන් කරගන්නා ලදී. එම ධර්ම දේශනාවට පාදක වූ ධර්ම කරුණ වන්නේ,

1. සම්මා දිට්ඨියයි 2. සම්මා කම්මන්තයයි
3. සම්මා ආජීවයයි 4. සම්මා වායාමයයි

18) " සර්වාස්තිවාදී " සංඝායනාව ලෙස හඳුන්වන ලද සංගායනාව වනුයේ,

1. අලු විහාර සංඝායනාව 2. කණිෂ්ක ධර්ම සංඝායනාව
3. දෙවන ධර්ම සංඝායනාව 4. තෙවන ධර්ම සංඝායනාව

19) ගුරුළුගෝමී පඬිතුමා විසින් රචිත අමාවතුර කෘතියේ ඇතුළත් වන්නේ,

1. අරහං බුදු ගුණයයි 2. සුගතෝ බුදු ගුණයයි
3. පුරිස ධම්ම සාරථී බුදු ගුණයයි 4. ලෝක විදූ බුදු ගුණයයි

20) බුදු දහමට ඉමහත් සේවයක් කළ හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ලක්දිවට පැමිණීමටද හේතු වූ, ලොව පුරා විශාල ප්‍රසිද්ධියක් ඉසිලූ, ක්‍රි.ව 1837 දී පැවති " පානදුරාවාදය " ජය ගැනීමට කටයුතු කළ භික්ෂූන් වහන්සේ වූයේ,

1. වාරියපොළ සුමංගල හිමි 2. රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමි
3. වැත්තෑවේ හිමි 4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

21) " අපි වෛර කරන්නවුන් අතර, අවෛරීව සුවසේ වාසය කරමු " මෙම අදහස සහිත ධම්ම පද ගාථාවේ මුල් පදය වනුයේ,

1. සබ්බේ තසන්ති දණ්ඩස්ස 2. අසාරේ සාර මතිනෝ
3. සුසුඛං වත ජීවාම 4. අක්කොච්ඡි මං අවධි මං

22) කළයුත්ත, නොකළයුත්ත තීරණය කිරීමේදී පදනම් කර නොගත යුතු යැයි, කාලාම සූත්‍රයේ දක්වා ඇති කරුණු ගණන,

1. 5කි 2. 7කි 3. 8කි 4. 10කි

23) චූල්ල කම්ම විභංග සූත්‍රයට අනුව, ගරු කළ යුතු අයට ගරු කරන, පිදිය යුත්තන් පුදන, මානයෙන් තොර වූ තැනැත්තා,

1. පහත් යැයි සම්මත කුලවල උපදී 2. වර්ණවත්ව උපදී
3. උසස් යැයි සම්මත කුලවල උපදී 4. දීර්ඝායුෂ උපදී

24) සම්මා සම්බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත්වරුන් බුද්ධ කාරක ධර්ම,

1. දහයක් සම්පූර්ණ කළ යුතුය 2. විස්සක් සම්පූර්ණ කළ යුතුය
3. තිහක් සම්පූර්ණ කළ යුතුය 4. තිස්පහක් සම්පූර්ණ කළ යුතුය

25) විසම සමාජයක් තුළ ජීවත් වන අපට වරදෙහි නොබැඳී දුසිරිතෙහි නොගැලී සිටීමට ආදර්ශ ලබා ගත හැක්කේ, බුදුරජාණන් වහන්සේගේ,

1. මහා ප්‍රඥාවෙනි 2. මහා කරුණාවෙනි
3. තාදි ගුණයෙනි 4. පද්මාකාර ජීවිතයෙනි

26) තමා මෙන්ම අනුන්ද එක සමාන යැයි සලකා දුක සැප දෙකෙහිදි ම එකම ලෙස ක්‍රියා කිරීම,

1. සාමානාත්මතාවයයි 2. සහජීවනයයි
3. සම ජීවිකතාවයි 4. සමචරියාවයි

27) දුප්පත් වී උපත ලැබුවද උසස් රූප සම්පත්තියකට හිමිකම් ලැබීම නිසා අකුසල කර්ම විපාක වැළකී, වාසනාවන්ත ජීවිතයකට මඟ පෑදීම සිදු වන්නේ ,

1. උපධි සම්පත්තිය නිසා ය 2. ගති සම්පත්තිය නිසා ය
3. පයෝග සම්පත්ති නිසා ය 4. කාල සම්පත්තිය නිසා ය

28) සත්ත්වයාගේ සසර පැවැත්මට මූලික හේතුව වන්නේ,

1. අවිද්‍යාව නිසා කුසල සහ අකුසල කර්ම රැස් කිරීමයි
2. මිනිස් ලොව සහ දෙව්ලොව සැප ලැබීමයි
3. සම්පත් රැස් කර ගැනීමයි
4. නිරතුරුවම පිංකම්වල නිරත වීමයි

29) " අනිච්චා වත සංඛාරා උප්පාද වය ධම්මිනෝ " යන ගාථාව ඇතුළත් වනුයේ,

1. පරාභව සූත්‍රයේය 2. මහා පරිනිබ්බාන සූත්‍රයේය
3. ධජග්ග සූත්‍රයේය 4. කරණීය මෙත්ත සූත්‍රයේය

30) ගිරිමානන්ද සූත්‍ර දේශනාවේ ඇතුළත් වන පරිදි රෝග වැළඳීමට බලපාන හේතු ගණන,

1. 03 කි 2. 05 කි 3. 08 කි 4. 10 කි

31) භික්ෂූන් වහන්සේලාගේ කායික රෝගවලට නියම කරන ලද බෙහෙත් වර්ග පිළිබඳව විස්තර සඳහන් වනුයේ,

1. විනය පිටකයේ ය 2. සූත්‍ර පිටකයේ ය
3. අභිධර්ම පිටකයේ ය 4. සේඛියා ධර්මවල ය

32) දේවාරාධනාව ලැබූ අප මහා බෝසතාණන් වහන්සේ මනුලොව උපත ලැබීම සඳහා කළ පූර්ව අධ්‍යයනය හඳුන්වනු ලබන නම,

1. සත්‍ය ගවේෂණය 2. පංචමහා විලෝකනය
3. මහා අභිනිෂ්ක්‍රමණය 4. කුසල ගවේෂණය

33) බුද්ධ දේශනාවට අනුව සමජීවිකතාවෙන් යුතු පුද්ගලයා යනු,

1. අඩු ආදායමක් සහිත වැඩියෙන් වියදම් කරන්නා ය
2. ආදායමට සමාන ලෙස වියදම් කරන්නා ය
3. ආදායම නොඉක්මවන ලෙසවියදම් කරන්නා ය
4. වැඩි ආදායමක් ඇති වැඩියෙන් වියදම් කරන්නා ය

34) බෝසතාණන් වහන්සේගේ නෙක්ඛම්ම පාරමිතාවට නිදසුනක් වන්නේ,

1. වණ්ණුපථ ජාතකයයි
2. මහා සාර ජාතකයයි
3. මඛාදේව ජාතකයයි
4. ලෝම හංස ජාතකයයි

35) බුදු දහමේ තුන්තරා බෝධිය ලෙස හඳුන්වන්නේ,

1. බුදු, පසේබුදු, මහරහත්
2. සිල, සමාධි, පඤ්ඤා
3. ජයසිරිමහා බෝධිය, ආනන්ද බෝධිය, ශ්‍රී මහා බෝධිය
4. අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤා

36) සිව්බඹ විහරණවලට අයත් අංග අතර සිතෙහි ඇතිවන මැදිහත් බව, හඳුන්වනුයේ,

1. මෙත්තා නමිනි
2. කරුණා නමිනි
3. මුදිතා නමිනි
4. උපේක්ඛා නමිනි

37) තමා උපමාකොට වරදින් වැළකී සිටීමේ ක්‍රමය බුදු දහමේ හඳුන්වනු ලබන්නේ,

1. සල්ලේඛ ප්‍රතිපදාව නමිනි
2. ධම්මාධිපතෙය්‍ය නමිනි
3. ලෝකාධිපතෙය්‍ය නමිනි
4. අත්තූපනායික ධර්ම පර්යාය නමිනි

38) " බුදුරජාණන් වහන්සේ , මහණෙනි බොහෝ දෙනාට හිත සුව පිණිස චාරිකාවේ හැසිරෙන්න යනුවෙන් දේශනා කළේ,

1. පස්වග මහණුන්ට ය
2. මුල්ම රහතන් වහන්සේලා හැට නමට ය
3. උරුවෙල් කාශ්‍යපට ය
4. යසකුල පුත්‍රයා ඇතුළු පිරිසට ය

39) විශාඛා මහා උපාසිකාව විසින් බුදුන් වහන්සේට පූජා කළ ආරාමය,

1. පූර්වාරාමයයි
2. ජේතවනාරාමයයි
3. වේළුවනාරාමයයි
4. නිග්‍රෝධාරාමයයි

40) සසර දුකින් නිදහස්ව තිවන් දක්නා ජාති දක්වා යම්කිසි භවයකදී විපාක දීමට ඉදිරිපත් වන්නේ,

1. දිට්ඨ ධම්ම වේදනීය කර්මයයි
2. උපපජ්ජ වේදනීය කර්මයයි
3. අපරාපරිය වේදනීය කර්මයයි
4. අහෝසි කර්මයයි

| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>Education Zone - Piliyandala | | | |
|---|---|---|---|
| වර්ෂ මැද ඇගයීම - 2017<br>Mid Year Evaluation | | | |
| ශ්‍රේණිය<br>Grade } 11 | විෂයය<br>Subject } බුද්ධ ධර්මය | පත්‍රය<br>Paper } II | කාලය<br>Time } පැය 02යි |

නම ............................................ විභාග අංකය ......................

සැළකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න. ( පිළිතුරු සැපයිය යුතු සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව 05 කි. )

01)

i. පාරමී පුරන ආකාරය අනුව සෑම පාරමිතාවක් ම කොටස් 03කට බෙදේ. ඉන් කොටස් 2ක් ලියා දක්වන්න.

ii. දස කුසලයන්ට අයත් වන වාචසික සුචරිත හතර ලියන්න

iii. " විනයෝ නාම සාසනස්ස ආයු " මෙම පාලි පාඨයෙහි අර්ථය පහදන්න.

iv. කර්මයේ බලපෑම කෙතරම් තීරණාත්මක වුවද වර්තමාන කර්මවලින් සහ පරිසර සාධක ඇසුරින් අතීත කර්ම ශක්තිය පාදා ගැනීමට, වෙනස් කිරීමට හෝ ඇතැම්විට නැති කර ගැනීමටද හැකියාව ඇත. එවැනි අවස්ථා 04ක් ගැන බුදු දහමෙහි සඳහන් වේ. ඉන් දෙකක් ලියන්න.

v. මිනිසාගේ මෙලොව හිත සුව පිණිස පවතින කරුණු 04ක් ව්‍යග්ඝපජ්ජ සූත්‍ර දේශනාවේ සඳහන් වේ. ඒ මොනවාදැයි දක්වන්න.

vi. බුදුරජාණන් වහන්සේගෙන් එක්තරා දේවතාවෙක් නැඟූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් උන් වහන්සේ දේශනා කර ඇති " දිවා රාත්‍රී පින් වැඩෙන පින්කම් " අතරින් 02ක් ලියා දක්වන්න.

vii. " ඉතිපිසෝ " පාඨයෙහි ඇතුළත් බුදු ගුණ 04ක් ලියන්න.

viii. අතිපූජ්‍ය රේරුකානේ චන්ද විමල මහ නාහිමිපාණන් වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ 02ක් නම් කරන්න.

ix. විදර්ශනා භාවනාව හඳුන්වන වෙනත් නම් 02ක් සඳහන් කරන්න.

x. " පුද්ගලයන් අතරත්, සමාජ කොටස් අතරත් සම්බන්ධය සමාජයක යහ පැවැත්මෙහි පදනමයි. ඒ සඳහා සදිසා නමස්කාරය මඟ පෙන්වයි "

ඉහත කරුණු විමසීමේදී ඔබට සිහිපත් වන සූත්‍ර දේශනාවේ නම ලියන්න.

බුදුරජාණන් වහන්සේ එම සූත්‍රය දේශනා කරන ලද්දේ කවුරුන් අරඹයා දැයි සඳහන් කරන්න

(ල. 2 × 10 - 20 )

02) i. දුකින් මිදීම සඳහා අනුගමනය කළ යුතු මාර්ගය වශයෙන් බුදු දහමෙහි පෙන්වා දී ඇත්තේ, කුමන මාර්ගයද?(ල.2)

ii. එම මාර්ගයට අයත් වන කරුණු නම් කරන්න.(ල.3)

iii. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබගේ ජීවිතයේ සාර්ථකත්වය උදෙසා එම කරුණු අදාළ කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.(ල.5)

03) **" පුද්ගලයාගේ පිරිසිදුකම හෝ අපිරිසිදුකම අනෙකකුට ලබා දිය හැක්කක් නොව තමා විසින්ම උදාකර ගනු ලබන්නකි.**

i. ඉහත අදහස ගැබ් වී ඇති පුද්ගල පාරිශුද්ධිය පිළිබඳ ඉතා වැදගත් ඉගැන්වීමක් ඇතුළත් ධම්මපද ගාථාව ලියා දක්වන්න.(ල.2)

ii. එහි අදහස සැකෙවින් දක්වන්න. (ල.3)

iii. පුද්ගලයෙකුගේ මෙලොව හා පරලොව ජීවිතය වාසනාවන්ත කර ගැනීම සඳහා ඉහත ධම්ම පද ගාථාව ඉවහල් කර ගත හැකි ආකාරය පෙන්වා දෙන්න. (ල.5)

04) i. සිතීමේ හා විමසීමේ නිදහස අගයමින් බුදු රජාණන් වහන්සේ විසින් දේශිත සූත්‍ර දේශනාව කුමක්ද? (ල.2)

ii. යමක් පිළිගැනීමේදී කරුණු 04ක් යටතේ, නිදහස්ව සිතා විමසා ක්‍රියා කළ යුතු බව බුදු දහමේ පෙන්වා දෙයි. එම කරුණු අතරින් 03ක් ලියා දක්වන්න. (ල.3)

iii. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් සිතා බලා විමසීමෙන් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න. (ල.5)

05) i. පටිච්ච සමුප්පාද මූල සූත්‍රය ලියා දක්වන්න. (ල.2)

ii. පටිච්ච සමුප්පාද න්‍යායට අදාළ අංග 12 අතුරින් 06ක් ලියන්න (ල.3)

iii. ගැටලු විසඳා ගැනීම සඳහා පටිච්ච සමුප්පාද න්‍යාය උපයෝගී කර ගත හැකි ආකාරය උදාහරණයක් දක්වමින් පෙන්වා දෙන්න. (ල.5)

06) **අද දක්වා ම නිර්මල බුදු දහම ආරක්ෂා වී පවතින්නේ ධර්ම සංගායනාවලදී ගත් උදාරතර පියවර හේතුවෙනි.**

i. පළමු හා දෙවන ධර්ම සංගායනා සඳහා ප්‍රධානත්වය ගත් රහතන් වහන්සේලා දෙනම සහ අනුග්‍රහය දැක්වූ රජවරුන් දෙදෙනා පිළිවෙළින් නම් කරන්න (ල.2)

ii. පළමුවැනි ධර්ම සංගායනාවේදී " විනය " පස් ආකාරයකින් සංග්‍රහ කරන ලදී. ඉන් 03ක් ලියා දක්වන්න. (ල.3)

iii. බුදු සසුනේ චිර පැවැත්මට අලු විහාර සංගායනාවෙන් ලද පිටිවහල පෙන්වා දෙන්න. (ල.5)

07) පහත සඳහන් මාතෘකාවලින් 02කට කෙටි සටහන් ලියන්න

i. බුදු සිරිතෙහි අභියෝග

ii. පුද්ගල විසමතා සහ කර්මය

iii. බුදු දහම පදනම් කරගත් ජීවන දැක්මක්

iv. ශ්‍රද්ධාව නිවන් මගෙහි පිවිසුමයි.

(ල. 5 × 2 - 10 )